(c) www.sinhalalyrics.com

මොංගෝලියානුවනී කහවන් ආසියාවේ
කොකේසියානුවනී සුදුවන් යුරෝ දෙසේ
නීග්‍රෝවරුනි කළුවන් අප්‍රිකාවේ
උරය පලා සැතකින් බලන් රුහිරූ
එක රතු පැහැයෙන් ගලා හැලෙන අයුරු

සිංහල ජනයිනි රුහුණු මායා පිහිටි රටේ
දමිළ ජනයිනි යාපා පටුනේ මඩකලපුවේ තිරිකුණාමලේ
මුස්ලිම් ජනයිනි බේරුවල හම්බන්තොට තිහාරියේ
උරය පලා සැතකින් බලන් රුහිරූ
එක රතු පැහැයෙන් ගලා හැලෙන අයුරු

බුදුණුවනී දන් පින් හී යෙදෙන පන්සලේ
කිතුණුවනී යදින යාතිකා දෙව් මැදුරේ
මුස්ලිමුනී කියන කුරානය පල්ලියේ
උරය පලා සැතකින් බලන් රුහිරූ
එක රතු පැහැයෙන් ගලා හැලෙන අයුරු

බමුණනි වරෝ වෙල්ලාවට පුණ නුලෙන් දිය ලණු බැඳගෙන
රජකයිනි ගනිව් සිහසුන වෙල්ලා හැලියෙන් සොදා අතපය
සිහල ගිණි දණ්ඩේ දමිළ වෙඩි උණ්ඩේ
ගෝත්‍රවාදී ඉලක්ක වලකා
සිහලුනේ යමව් යාපා පටුනට දමිළයිනි වරෝ රුහුණට

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ඔස්ටින් මුණසිංහ

(c) www.sinhalalyrics.com